# තම්මැන්නා ප්‍රදේශයේ අඩුක්කු කංකාරිය පිළිබඳ විමර්ශනයක්

**සුජානි සෝමසිරි**[1]

සිංහල කෘෂි සංස්කෘතියෙහි අලුත් බත් පිදීමේ චාරිත්‍රයට ප්‍රමුඛස්ථානයක් ලැබිණි. මේ චාරිත්‍රය ප්‍රාදේශිකව විවිධාකාරව සිදුවිණි. විශේෂයෙන් කෘෂි සංස්කෘතියේ ප්‍රමුඛත්වය ලැබුණේ දෙවියන්ටය. බුදුන් වහන්සේට බුද්ධ පූජාව තැබීමේ දී අනුගමනය නොකරන විචිත්‍ර පිළිවෙත් දෙවියන් උදෙසා පූජා තැබීමේ දී අනුගමනය කළහ. **අඩුක්කු කංකාරිය**, තම්මැන්නාව හා තදාසන්න ප්‍රදේශවල පැවති දෙවියන් පිදීමේ එවැනි පූජා විධියකි. තම්මැන්නා ගැමියෝ මහත් පරිශ්‍රමයක් දරා දෙවියන් උදෙසා අඩුක්කු කංකාරිය පැවැත්වූහ. මෙම පූජාවෙන් ඔවුන් අපේක්ෂා කළේ ගොවිතැන සහ හරක බාන ආරක්ෂා කර ගැනීමත් අස්වැන්න සශ්‍රීක කර ගැනීමත් තම ප්‍රදේශයට, වැවට සහ කුඹුරට ආරක්ෂාව ලබා ගැනීමත්ය. තම්මැන්නාවට අධිගෘහිත දෙවිවරු ලෙස පිළිගැනෙන වීරමුණ්ඩ, දැඩිමුණ්ඩ, කඩවර, අයියනායක සහ ගලේ බණ්ඩාර යන දෙවිවරු ප්‍රමුඛ කොට ගෙන මේ මංගල්‍යය පැවැත්විණි. මෙය ගොවි මංගල්‍යයක් වශයෙන් ද හැඳින්විය හැකිය. වර්තමානයේ මේ කංකාරි පිළිවෙත් අභාවයට පත් ව ඇත.

සම්ප්‍රදායානුකූලව මේ අඩුක්කු කංකාරිය පැවැත්විය යුතු වන්නේ ගමරාළගේ නිවසේ දී ය. මෙම මංගල්‍යය සඳහා ගමේ සෑම නිවසකින් ම හාල්, පොල්, එළවළු සහ පළතුරු ලබා ගැනේ. මේ සඳහා සෑම ගැමියෙකු ම සහභාගි විය යුතු ය යන අදහසක් ගැමියන් තුළ පැවතිණි. අඩුක්කු කංකාරිය සඳහා අත්‍යවශ්‍ය ම පූජා ද්‍රව්‍යයක් වූයේ වෙල් මාළුය. කෙසෙල් කැන් වළ දැමීම සඳහා ද ගමේ එක් පුද්ගලයෙකු තෝරා ගැනෙයි. එසේ තෝරා ගැනීම තමන් ලැබූ වාසනාවක් ලෙස ඔවුහු සිතති. කෙසෙල් කැන් වළ දමන පුද්ගලයාට යාගයේ විශේෂ තැනක් හිමි වේ. ඔහු කිලි කුණුවලට හසු වුවහොත් කෙසෙල් කැන් නොඉදෙනු ඇතැයි විශ්වාසයක් පවතී. කංකාරිය පැවැත්වීම සඳහා තෝරා ගැනෙන්නේ සෙනසුරාදා දිනයකි. අඩුක්කු පිළියෙළ කරන්නන් හඳුන්වන්නේ කොට්ටෝරුවන්

---

[1] සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: nmllknarayanan@yahoo.co.in

යන නාමයෙනි. ඒ සඳහා තෝරා ගැනෙන්නේ වහුම්පුර කුලයට අයත් ගැමියන් පමණි. මේ කාර්යයන් සඳහා කිසිදු හේතුවක් නිසා හෝ ස්ත්‍රීන් සහභාගි කර නොගැනේ. කංකාරිය සඳහා බලි ඇදුරෙක් හෝ කපු මහතෙක් කැඳවා ගනු ලැබේ. පුද පඬුරු පිදීම සහ යාතිකා කීම අවසන් වූ පසු ආහාර ගොටුවක් පෙරහැරින් ගෙන ගොස් තුංමංසලක තබනු ලැබේ. ගොටුව තැබීමෙන් පසු සියලු දෙනා පැමිණ ආහාර භුක්ති විඳිති. එදින රාත්‍රිය මුළුල්ලේ ගැමි නැටුම්, ජනකවි සහ ජනක්‍රීඩා පවත්වති. තම්මැන්නා ප්‍රදේශයට විශේෂිත වූ අඩුක්කු කංකාරිය පිළිබඳ විමසා බැලීම මේ පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වේ.

**ප්‍රමුඛ පදඃ** අඩුක්කු කංකාරිය, තම්මැන්නා, සිංහල කෘෂි සංස්කෘතිය
**Title:** A study of the Adukku Kankariya in Tammanna region
**Keywords:** Adukku Kankariya, Thammanna, Sinhala agrarian culture